## 457 ලස්සන කුසුමන්

ලස්සන කුසුමන් පොබ යන්නේ
මඳ තල සුවඳින් නැහැ වෙන්නේ
මොක් පුර මුනිඳුන් වැජඹෙන්නේ
දරු කැල වරමින් සරසන්නේ

ලිලී මලින් ඔබ සරසාලා
සන්තන්තෝනි මුනි පසසාලා
ගීත මලින් ඔබ නමැ ගයලා
දිව එමු ඔබ සරණා පතලා

පාදුවා නගරේ විසූ මුනිඳේ
ඔබ ගෙවූ සොඳ දිවි අනු යම්නේ
ලොවැ සිට දෙවි වෙත යන ගමනේ
මං උපදෙස් දුන මැන මුනිඳේ

කිතු දුන් ජීවය ලොව මිදුවා
ඔබතුම එම ජීවය ගෙව්වා
ඒ දිවි දෙවිඳෝ පින වූවා
සගපුර සඳසුන් ඔබ ලැබුවා

පරවුන මල් නැත පිබිදෙන්නේ
මැරුණම නැත ලොව උපදින්නේ
දෙවි පෙම එබැවින් වඩමින්නේ
දිවි ගෙවුමටැ පිහිටා වන්නේ